

# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

# ශ්‍රී ලංකාවේ වේත්‍රධාරි ධුරය
# එහි ඉතිහාසය සහ මෙහෙවර,
# අරමුණු සහ කාර්යයන්


සම්පාදනය
නරේන්ද්‍ර ප්‍රනාන්දු
වේත්‍රධාරි





රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

# ශ්‍රී ලංකාවේ වේත්‍රධාරි ධූරය
# එහි ඉතිහාසය සහ මෙහෙවර
# අරමුණු සහ කාර්යයන්

PL 11723 - 250 (2019/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

## පටුන


| | | පිටුව |
|---|---|---|
| 1. | පසුබිම | 1 |
| 2. | ශ්‍රී ලංකාවේ චේත්‍රධාරි ධුරය සහ එහි ඉතිහාසය | 2 - 4 |
| 3. | මෙහෙවර | 5 |
| 4. | අරමුණු | 6 - 7 |
| 5. | කාර්යයන් | 8 - 14 |
| 6. | දෙපාර්තමේන්තුවේ සංයුතිය | 15 |
| 7. | දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය | 16 |
| 8. | ඇමුණුම ''අ'' | 17 |
| 9. | ඇමුණුම ''ආ'' | 18 |
| 10. | ඇමුණුම ''ඇ'' | 19 - 20 |
| 11. | සෙංකෝලයේ සැකැස්ම | 21 |
| 12. | ඇමුණුම ''ඈ'' | 22 - 23 |
| 13. | ඇමුණුම ''ඉ'' | 24 - 25 |
| 14. | ඇමුණුම ''ඊ'' | 26 |
| 15. | ඇමුණුම ''උ'' | 27 |
| 16. | ඇමුණුම ''ඌ'' | 28 |
| 17. | ඇමුණුම ''එ'' | 29 |



නරේන්ද්‍ර ප්‍රනාන්දු
වේත්‍රධාරී
(2018 අගෝස්තු සිට මේ දක්වා)



කුෂාන් සම්පත් ජයරත්න
නියෝජ්‍ය වේත්‍රධාරී



අචින්ත ශ්‍රීමාල් කුරේ
සහකාර වේත්‍රධාරී

## හිටපු වේත්‍රධාරීන්



එම්. ඉස්මයිල්, එම්. බී. ඊ.
පළමු වේත්‍රධාරී
(1947 - 1961)



ජේ. ආර්. ද සිල්වා
(1961 - 1970)



රොනී අබේසිංහ
(1970 - 1996)



විජය පල්ලියගුරුගේ
(1996 - 2006)



අනිල් පරාක්‍රම සමරසේකර
(2006 - 2018)

## හිටපු නියෝජ්‍ය වේත්‍රධාරීන්



එච්. ඒ. බී. වනසිංහ
(1982 - 1989)



වී. බී. කරුණාරත්න
(1991 - 1997)

# ශ්‍රී ලංකාවේ වේත්‍රධාරී ධුරය එහි ඉතිහාසය සහ මෙහෙවර, අරමුණු සහ කාර්යයන්

## පසුබිම

- වේත්‍රධාරී ධුරයේ ආරම්භය අතීත බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ඉතිහාසයේ මුල් අවධියේ සනිටුහන් වී ඇත.

- ආරම්භයේ දී වේත්‍රධාරින් වූයේ රජුගේ පුද්ගලික ආරක්ෂකයින්ය.

- ක්‍රිස්තු වර්ෂ 1279 දී එංගලන්තයේ පළමු එඩ්වඩ් රජු පුද්ගලික ආරක්ෂකයින් 20 දෙනෙකුගෙන් සමන්විත වේත්‍රධාරින් පිරිසක් පත් කළේය.

- මීට වසර 80 කට පෙර ප්‍රංශයේ ෆිලිප් ඔගස්ටස් රජු හට පුද්ගලික ආරක්ෂකයන්ගෙන් සමන්විත වේත්‍රධාරී පිරිසක් සිටි බව වාර්තා වී ඇත.

- ක්‍රිස්තු වර්ෂ 1415 දී පළමු වේත්‍රධාරියා එංගලන්තයේ දෙවැනි රිචඩ් රජු විසින් පත්කරන ලද්දේ බ්‍රිතාන්‍ය නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ කථානායකවරයා වෙත සේවය සැපයීමට වන අතර නිකලස් මවුඩිට් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ පළමු වේත්‍රධාරියා විය.

- වේත්‍රධාරී තනතුර අතීතයේ දී ''සාර්ජන්ට්''; ''සෙංකෝලය දරන්නා''; ''මහත්වරුන් හට අසුන් පනවන්නා'' (Gentleman Usher); ලෙස ද හැඳින්විණ.

- ආරම්භයේ දී ''වේත්‍රධාරිවරුන්'' හට රජුගේ ශරීර ආරක්ෂකයාගේ භූමිකාව හිමි විය.

- බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමයේ විකාශයත් සමග නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ මුලසුන රජු හෙබවීමේ පිළිවෙත වෙනස් වී ඒ වෙනුවට රජුගේ නියෝජිතයා වශයෙන් කථානායකතුමා මුලසුන දැරීය.

- කථානායකතුමාට කෙරෙන ගරු කිරීමක් වශයෙන් සහ රජුගේ බලාධිකාරිය සංකේතවත් කිරීම පිණිස, එතෙක් රජුගේ පුද්ගලික ආරක්ෂකයා වූ වේත්‍රධාරියා හට සෙංකෝලයේ භාරකරුවීමේ රාජකාරිය පැවරිණි.

- සෙංකෝලය දරන්නා වශයෙන් සභාවේ වරප්‍රසාද ආරක්ෂා කිරීම ද ඔහුගෙන් අපේක්ෂා කෙරිණ. කථානායකතුමා භාරකරු වශයෙන් ද වේත්‍රධාරියා බලාත්මක කරන්නා ලෙස ද සැලකිණි.

- වේත්‍රධාරියා යනු සභාවේ නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා නීත්‍යානුකූල බලයක් හිමි සහ පිළිගත් නිලධාරියා වේ.

## ශ්‍රී ලංකාවේ වේත්‍රධාරී ධූරය සහ එහි ඉතිහාසය

- සෙංකෝලයක් පැවතීමේ අවශ්‍යතාවය සහ වේත්‍රධාරිවරයකු පත්කිරීමේ අවශ්‍යතාවය පළමුවරට සලකා බලන ලද්දේ ලංකාවේ එවකට පැවති පාර්ලිමේන්තුව විසින් 1931 ජූලි මස 20 වැනි දිනයි.

- එවකට සිටි කථානායක, ආචාර්ය ෆ්‍රැන්සිස් මොලමුරේ, සුසන්ත ද ෆොන්සේකා, මේජර් ජේ.ඩබ්ලිව්. ඕල්ඩ්ෆීල්ඩ්, ආචාර්ය වී.ආර්. ෂොක්මන්, ඩී.ඩී. ඇතුලත්මුදලි සහ එවකට රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ලේකම් වූ ජී.එන්. ෆාකාර් යන මහත්වරුන් විසින් මෙම ගැටලු සලකා බලන ලදී.

- 1933 මාර්තු මාසයේ දී රාජ්‍ය මන්ත්‍රණ සභාව විසින් වේත්‍රධාරියාගේ බලතල සහ කාර්යය භාරයන්, වේත්‍රධාරී කාර්ය මණ්ඩලය සහ ගැලරි වෙත අමුත්තන් ඇතුළත් කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය ඇතුළු ඇතැම් වෙනත් කරුණු සලකා බලන ලදී.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 (3) වගන්තිය අනුව ගරු කථානායකතුමාගේ අනුමැතිය සහිතව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් වේත්‍රධාරියා පත්කරනු ලැබේ. (කරුණාකාර ඇමුණුම "අ" බලන්න)

- ප්‍රථම වේත්‍රධාරියා පත්කරනු ලැබූයේ 1947 වර්ෂයේ දී වන අතර, 1949 වර්ෂයේ දී මහා බ්‍රිතාන්‍ය නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සෙංකෝලය ත්‍යාග කරන ලදී. (කරුණාකර ඇමුණුම "ආ" බලන්න)

  එම්.ඉස්මයිල්, එම්.බී.ඊ. ප්‍රථම වේත්‍රධාරියා වූ අතර වර්ෂ 1947 සිට 1961 දක්වා එම ධූරය හොබවන ලදී. ඉන්පසු, පහත නිලධාරීන් එම ධූරයට පත්විය :-

| | |
|---|---|
| ජේ. ආර්. ද සිල්වා මහතා | - 1961 සිට 1970 |
| රොනී අබේසිංහ මහතා | - 1970 සිට 1996 |
| විජය පල්ලියගුරුගේ මහතා | - 1996 සිට 2006 |
| අනිල් පරාක්‍රම සමරසේකර මහතා | - 2006 සිට 2018 අගෝස්තු දක්වා |
| නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා | - 2018 අගෝස්තු සිට අද දක්වා |

- වේත්‍රධාරියා පාර්ලිමේන්තුවේ බලාධිකාරය සංකේතවත් කරන "සෙංකෝලයේ" භාරකාරිත්වය හොබවන අතර (කරුණාකාර ඇමුණුම "ඇ" බලන්න) සභාව තුළ දී මූලාසනය විසින් දෙනු ලබන නියෝග ක්‍රියාත්මක කරනු ලබන නිලධාරියා ඔහුය. කරුණාකර ඉහළ මන්ත්‍රී මණ්ඩලයේ (සෙනෙට් මණ්ඩලයේ) සෙංකෝලය සම්බන්ධයෙන් වන ඇමුණුම "එ" බලන්න.

- යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු මූලාසනයේ බලයට අවනත නොවීම හෝ නොසලකා සිටීම හේතුකොටගෙන හෝ සිතාමතා යළි යළිත් සභාවේ කටයුතුවලට බාධා කරමින් ක්‍රියා කිරීම හෝ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග උල්ලංඝනය කිරීම හේතුකොටගෙන අදාළ මන්ත්‍රීවරයා සභා ගර්භයෙන්

ඉවත් කිරීමට හෝ එම මන්ත්‍රීවරයාගේ පාර්ලිමේන්තු සේවය තාවකාලිකව අත්හිටුවීමට මූලාසනය මගින් දෙනු ලබන නියෝගයක් ක්‍රියාත්මක කිරීමට හෝ වේත්‍රධාරියාට බලය ඇත. එවන් අවස්ථාවල දී ස්ථාවර නියෝග 77 සිට 80 දක්වා බලාත්මක වේ. (කරුණාකර ඇමුණුම "ඈ" බලන්න)

- යම් සාක්ෂිකරුවකු, චූදිතයකු හෝ වෙනත් යම් පුද්ගලයකු සභාවේ සීමාව වෙත කැඳවනු ලබන විටෙක එවන් තැනැත්තන් සභාවේ සීමාව වෙත කැටුව යාමේ බලය වේත්‍රධාරියා සතුය.

- පාර්ලිමේන්තු රැස්වීම් දිනයක පාර්ලිමේන්තු පරිශ්‍රය හෝ එහි ගොඩනැගිල්ල තුළ අවිනීත හැසිරීමක් හෝ නීතිවිරෝධී අයුරින් පාර්ලිමේන්තු ගොඩනැගිල්ල තුළට ඇතුළුවීම හෝ බාධා කිරීම් සිදුකිරීම හෝ එවැනි යමක් කිරීමට අන් අය වෙත සහාය සැපයීම සම්බන්ධයෙන් කථානායකවරයා විසින් ලබාදෙනු ලබන ලිඛිත හෝ වාචික නියෝගයක් මත වැරදිකරු වන ඕනෑම පුද්ගලයෙකු වරෙන්තුවකින් තොරව අත්අඩංගුවට ගැනීමටත්, පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත සහ ස්ථාවර නියෝග යටතේ එම පුද්ගලයාට යම් දඬුවමක් ලබාදිය හැකි ද නොහැකි ද යන්න පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන තෙක් එම පුද්ගලයා තම අත්අඩංගුවේ තබාගැනීමේ බලය ද වේත්‍රධාරියා සතුය. (කරුණාකර ඇමුණුම "ඉ" බලන්න).

- අත්අඩංගුවට ගත් එවන් පුද්ගලයින් භාරදීම ද ඇතුළුව කථානායකතුමාගේ නියෝග ප්‍රකාරව අදාළ කාර්ය පටිපාටිය වේත්‍රධාරී විසින් සිදු කෙරේ.

- පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් සභාව තුළ යම් කරුණක් මතු කළ විට ඒ පිළිබඳව නොපමාව සොයා බලන මෙන් වේත්‍රධාරීවරයාට නියම කරනු ලබන අතර, එම කරුණ සම්බන්ධයෙන් අපක්ෂපාතී වාර්තාවක් ලබාදීමට වේත්‍රධාරී බැඳී සිටියි.

- අනුචිත ඇඳුමින් සැරසී (අනුමත ඇඳුමින් සැරසී නොමැති) පාර්ලිමේන්තු සභා ගර්භයට ඇතුළුවන ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගෙන් නොපමාව සභා ගර්භයෙන් ඉවත්වන ලෙස ඉල්ලා සිටීමට වේත්‍රධාරියාට හැකිය. (කරුණාකර ඇමුණුම "ඊ") බලන්න)

- තම රාජකාරි ඉටුකිරීමේ දී වේත්‍රධාරී විසින් සභා ගර්භය තුළ ප්‍රධාන දොරටුව අසළ පිහිටා ඇති විශේෂ අසුනක් හොබවනු ලැබේ.

- තම උත්සවීය ඇඳුමේ කොටසක් වශයෙන් සභා ගර්භය තුළට ආයුධයක් (කඩුව) රැගෙන යාමේ අවසරය ඇති එකම පුද්ගලයා වේත්‍රධාරියා වේ.

- වේත්‍රධාරියා පොදු රාජ්‍ය මණ්ඩලීය වේත්‍රධාරීවරුන්ගේ සංගමයේ සාමාජිකයකුවන අතර පාර්ලිමේන්තු කළමනාකරණයේ නව ප්‍රවණතා පිළිබඳ දැනුවත්වීම සඳහා එම සංගමයේ රැස්වීම් සඳහා සහභාගි වෙයි.

- පාර්ලිමේන්තු වරප්‍රසාදවල ආරක්ෂකයාවන ගරු කථානායකතුමා විසින් නිකුත් කරනු ලබන නියෝග ක්‍රියාත්මක කිරීමට නීතියෙන් බලය දී ඇති ප්‍රධාන බලාත්මක කරන්නා වේත්‍රධාරියා වේ.

- වේත්‍රධාරී පත් කිරීම සහ විශ්‍රාම යාම සම්ප්‍රදායක් වශයෙන් පාර්ලිමේන්තුවේ නිවේදනය කරනු ලැබේ. එසේම, වේත්‍රධාරියෙකු විශ්‍රාම යන අවස්ථාවේදී එම වේත්‍රධාරියාගේ සේවය සම්බන්ධයෙන් සිදු කරනු ලබන අගය කිරීමේ යෝජනාවක් සම්මත කර ගැනීමට පාර්ලිමේන්තුවේ දිනයක් වෙන් කරනු ලැබේ. (කරුණාකර ඇමුණුම් "උ" සහ "ඌ" බලන්න).

- පාර්ලිමේන්තුවේ වැදගත්ම දෙපාර්තමේන්තුවලින් එකක් වන වේත්‍රධාරී දෙපාර්තමේන්තුව එහි ඇති දෙවැනි පැරණිතම දෙපාර්තමේන්තුව වන අතර ප්‍රථම දෙපාර්තමේන්තුව වන්නේ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්යාලයයි.

- වේත්‍රධාරියාගේ වත්මන් රාජකාරී පාර්ලිමේන්තු කටයුතුවලදී කේන්ද්‍රස්ථානයක් ගන්නා බොහෝ දුරට පරිපාලනමය ස්වභාවයකින් යුක්ත කාර්ය භාරයක් වශයෙන් විස්තර කළ හැකිය.

- පාර්ලිමේන්තුව රැස්වන සාමාන්‍ය දිනවලදී වේත්‍රධාරී සුදු පැහැති නිල ඇඳුමකින් සැරසී සිටින අතර උත්සවාකාර අවස්ථාවලදී විශේෂයෙන් නිර්මාණය කළ කළු පැහැති උත්සවීය නිල ඇඳුමකින් සැරසේ. වේත්‍රධාරී තනතුර ලුතිනන් ජෙනරාල්වරයෙකුගේ තනතුරට සමාන වේ.

- උත්සවීය, සභා ගර්භය, ආරක්ෂාව, අමුත්තන් පරිපාලනය, ඉඩ පහසුකම් සහ දෙපාර්තමේන්තු කටයුතු වේත්‍රධාරියාගේ කාර්යභාරයන්ට ඇතුළත් වේ. (අරමුණු හා කාර්යයන් පිළිබඳ සවිස්තරාත්මක ලැයිස්තුවක් මෙම ලේඛනයේ ඇතුළත් වේ.)

- වර්තමානයේදී වේත්‍රධාරී ධුරය හොබවන නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා හට සිය තනතුරේ රාජකාරී නිසි අයුරින් ඉටු කිරීම සඳහා නියෝජ්‍ය වේත්‍රධාරී කුෂාන් ජයරත්න මහතාගේ සහ ඔහුගේ සහකාර වේත්‍රධාරී අචින්ත කුරේ මහතාගේ සහය හිමිවේ.



# මෙහෙවර

ගරු කථානායකතුමාට සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාට ඉහළම ගුණාත්මක සේවාවක් කාලානුරූපීව සහ කාර්යක්ෂම අන්දමින් සපයා දී, පාර්ලිමේන්තුවේ සඵලදායී ක්‍රියාකාරීත්වයට පහසුකම් සැපයීම.

# අරමුණු

**උත්සවීය**

- පාර්ලිමේන්තුවේ සහ කථානායකතුමාගේ උත්සවීය කටයුතු/ක්‍රියාකාරකම් (රාජ්‍ය අවමංගල්‍ය උත්සව සම්බන්ධ කටයුතු ද ඇතුළුව) නිසි සම්මතයන්ට අනුව සංවිධාන කිරීම.

**සභා ගර්භය**

- කථානායකතුමාට සේවය ලබා දීම සහ සභාවේ විධායක අධිකාරය වන කථානායකතුමාට සේවය කිරීම තුළින් පැන නගින අනෙකුත් කාර්යයන් ඉටු කිරීම.

- සභා ගර්භයට සහ කාරක සභාවලට කාර්යක්ෂම අන්දමින් කටයුතු කිරීම සඳහා උපකාරී වන කාර්ය මණ්ඩලයක් සහ පහසුකම් ලබා දීම තුළින් ව්‍යවස්ථාදායක ක්‍රියාවලියට ඉහළ තත්ත්වයේ ඍජු සහයක් පිරිනැමීම.

**ආරක්ෂාව**

- ප්‍රචණ්ඩ ක්‍රියා, හදිසි අනතුරු සහ ගිනි උවදුරු හේතුවෙන් උද්ගත විය හැකි අවදානම්වලින් පාර්ලිමේන්තු සංකීර්ණයේ සේවය කරන සහ ඊට පැමිණෙන පුද්ගලයින්ගේ සුරක්ෂිත බව සහතික කිරීම සඳහා එම තත්ත්වයන් කළමනාකරණය කර අවම කිරීමෙන් සමස්ථ පාර්ලිමේන්තු සංකීර්ණය තුළ ආරක්ෂිත පරිසරයක් සහ අවශ්‍ය යටිතල පහසුකම් ගොඩ නැගීම.

- පාර්ලිමේන්තු පොලිස් කොට්ඨාසයේද සහය ඇතිව පාර්ලිමේන්තුවේ සහ එය අවට ප්‍රදේශයෙහි භෞතික ආරක්ෂාව විධිමත්ව හා කාර්යක්ෂමව පවත්වාගෙන යාම සහ පාර්ලිමේන්තුව හා එම පරිශ්‍රය තුළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, කාර්ය මණ්ඩලය සහ අමුත්තන්ගේ ආරක්ෂාව සැලසීම සම්බන්ධයෙන් කථානායකතුමාට සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාට ප්‍රයෝජනවත් උපදෙස් ලබා දීම.

- පාර්ලිමේන්තු පරිශ්‍රය තුළ විධිමත් විනය පටිපාටියක් පවත්වාගෙන යාම.

- පාර්ලිමේන්තු සංකීර්ණය අවට පිහිටා ඇති අධි ආරක්ෂිත කලාපය වටා ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා දීමේදී පරීක්ෂාවන් නිසි ආකාරයෙන් සිදු කෙරෙන බවට සහතික කර ගැනීම.

- පහත සඳහන් කටයුතු ද ඇතුළුව පාර්ලිමේන්තුවේ ආරක්ෂක විධිවිධාන සම්බන්ධයෙන් පාර්ලිමේන්තු පොලිස් කොට්ඨාසයේ අධ්‍යක්ෂවරයා සමඟින් ඒකාබද්ධව ක්‍රියා කිරීම-

    - ප්‍රවේශ පාලනය
    - ආරක්ෂක පරීක්ෂා
    - ප්‍රතිචාර දැක්වීමේ හැකියාවන් පවත්වාගෙන යාම

- තාක්ෂණික ආරක්ෂාව
- ත්‍රිවිධ හමුදාව, පොලීසිය සහ බුද්ධි අංශ සමඟින් සම්බන්ධ වීම
- විශේෂිත සම්පත් සම්බන්ධීකරණය
- විදේශීය ප්‍රභූවරුන් ද සම්බන්ධ වන වැදගත් අවස්ථා සැලසුම් කිරීම සහ;
- විශේෂ කාණ්ඩයේ තර්ජන සම්බන්ධයෙන් සැලසුම් කිරීම.

**අමුත්තන් පරිපාලනය**

- පාර්ලිමේන්තු සංකීර්ණයට පුද්ගලයින් ඇතුළත් කර ගැනීම පාලනය සහ නියාමනය.
- පාසල් චාරිකා සහ පාර්ලිමේන්තුවට පැමිණෙන වෙනත් පුද්ගලයින් සඳහා පහසුකම් සැලසීම.

**ඉඩ පහසුකම්**

- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පාර්ලිමේන්තුවේ සේවය කරන සියලු දෙනා හට සහ පාර්ලිමේන්තුව නැරඹීමට පැමිණෙන්නන්ට ගුණාත්මක පරිසරයක් සහ අවශ්‍ය පහසුකම් සලසා දීම මඟින් පාර්ලිමේන්තු සංකීර්ණය රාජකාරී කටයුතු කිරීම සඳහා ආරක්ෂිත සහ නැරඹීම සඳහා ප්‍රියමනාප ස්ථානයක් ලෙස පවත්වා ගැනීම සහතික කිරීම.

  කාරක සභා සහ සම්මුඛ සාකච්ඡා කාමර වෙන් කරදීම ද ඇතුළුව සමස්ත පාර්ලිමේන්තු ගොඩනැගිල්ලෙහි ඉඩකඩ වෙන් කරදීම පාලනය සහ ඒ පිළිබඳ උපදෙස් දීම.

**දෙපාර්තමේන්තු**

- ආයතන ප්‍රධානියා සතු කාර්යභාරයයන් වන ක්‍රමෝපායික නායකත්වයක් ලබා දීම මෙන්ම දෙපාර්තමේන්තුව සතු සම්පත්වල සමස්ත කළමනාකරණය සඳහා ඵලදායී සහ කාර්යක්ෂම ලෙසින් සහයෝගය ලබා දීම සහ ගුණාත්මක උපදේශන මෙන්ම කාර්යක්ෂම හා ඵලදායී සහාය සේවාවන් සැපයීම.
- පාර්ලිමේන්තු සංකීර්ණයේ සේවය කරන සහ එය නැරඹීමට පැමිණෙන සියලු දෙනා හට, උසස් තත්ත්වයේ පාරිභෝගික/දුරකථන සේවාවක් පිළිගත් ප්‍රමිතියකට අනුව සැපයීම.

# කාර්යයන්

**උත්සවීය**

- පාර්ලිමේන්තුවේ පැවැත්වෙන සියලු උත්සවීය අවස්ථා නිසි ප්‍රමිතියට අනුකූලව ප්‍රධාන උත්සවීය නිලධාරියා ලෙස සංවිධාන කිරීම සහ මෙහෙයවීම. (රාජ්‍ය අවමංගල්‍ය උත්සව සම්බන්ධ කටයුතු ද ඇතුළුව)
- පූර්වතා අනුපිළිවෙළට අදාළ සන්ධාන කටයුතු සම්බන්ධයෙන් කථානායකතුමා සහ පාර්ලිමේන්තුවේ මහලේකම්තුමාට උපදෙස් ලබා දීම.
- සෙංකෝලයේ භාරකරු, තනතුරේ උත්සවීය රාජකාරි ඉටු කිරීමේදී ප්‍රමුඛස්ථානයක් ගනී.
- කථානායකතුමා සහ සභාව වෙනුවෙන් උත්සවීය අවස්ථා සහ වැඩසටහන් සඳහා යෝජනා ඉදිරිපත් කිරීම, නිර්මාණය සහ ක්‍රියාත්මක කිරීම.
- කථානායකතුමා වෙත නිල ඇඳුම/නිල ලාංඡනය/නිල ධජය සැපයීම සහ වෙනත් නිල අවශ්‍යතාවන් ඉටු කරදීම.
- කථානායකතුමාගේ සහ පාර්ලිමේන්තුවේ මහලේකම් තුමාගේ අමුත්තන් (අති විශේෂ/විශේෂ) පිළිගැනීම.
- අභාවප්‍රාප්ත ජනාධිපතිවරුන්ගේ සහ අග්‍රාමාත්‍යවරුන්ගේ ආලේඛ්‍ය චිත්‍ර ද ඇතුළුව එක් එක් පාර්ලිමේන්තුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඡායාරූප ප්‍රදර්ශනයට අදාළ කටයුතු සිදු කිරීම
- පාර්ලිමේන්තුවේ ජාතික/ආගමික උත්සවවලට අදාළ කටයුතු සිදු කිරීම.
- පාර්ලිමේන්තුව සංවිධාන කරන අන්තර් ජාතික සමුළු, සම්මන්ත්‍රණවලට අදාළ උත්සවීය කාර්යයන් සිදු කිරීම.

**සභා ගර්භය**

- රැස්වීම් පැවැත්වෙන දින ආරම්භයේ සහ අවසානයේ කථානායකතුමා සමඟ පිළිවෙලින් සෙංකෝලය අතැතිව සභාවට ඇතුළුවීම හා පිටවීම.
- සභාව හෝ සමස්ත සභාව කාරක සභාවක් බවට පත්ව රැස්ව සිටින සම්පූර්ණ කාලය තුළ සභා ගර්භයේ රැඳී සිටීම.
- සභාවේ රැස්වීම් පැවැත්වෙන අතරතුර සභා සීමාව තුළ විනය පවත්වාගෙන යාම.
- නවක පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හට දිවුරුම / නිල ප්‍රතිඥාව ලබා දීමට පහසුකම් සැලසීම සහ පාර්ලිමේන්තු මේසය වෙත, මුලසුන හොබවන මන්ත්‍රීවරයා වෙත හා වෙන් කර ඇති අසුන වෙත කැඳවාගෙන යාම.

- සභාවේ නියෝග සහ කථානායකතුමා විසින් නිකුත් කරනු ලබන වරෙන්තු අනුව ක්‍රියා කිරීම හෝ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය.

- සභාව විසින් නියෝග කරන සෑම පුද්ගලයෙකු ම අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම.

- අත්අඩංගුවේ පසුවන පුද්ගලයා හට අවවාද කිරීමට හෝ සාක්ෂිකරුවෙකු ලෙස විභාගයට ලක් කිරීම සඳහා හෝ පාර්ලිමේන්තු මේසය වෙත රැගෙන ඒම.

- කථානායකතුමාගේ අනුමැතියට යටත්ව පාර්ලිමේන්තු සභා ගර්භයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා අසුන් වෙන් කර දීම සහ අසුන් පැනවීමේ සැලැස්ම සකස් කිරීම.

- සභාවේ ගැලරියේ සහ ආලින්දයන්හි නිසි පාලනයක් පවත්වාගෙන යාම සහ ආරක්ෂාව තහවුරු කිරීම.

- සභා ගර්භයේ යම් කොටසක හෝ ප්‍රධාන කාරක සභාවක් රැස් වන කාමරයක හෝ ඕනෑම ගැලරියක හෝ කැළඹීමක් ඇති කරන ඕනෑම පිට අයෙකු හෝ සභාව හෝ ප්‍රධාන කාරක සභාව රැස්වන අවස්ථාවකදී පිට අයට ඉවත් වන ලෙසට නියෝග කර ඇති අවස්ථාවක හෝ ඉවත් නොවන ඕනෑම පුද්ගලයෙකු ඉවත් කිරීම.

- පාර්ලිමේන්තු සේවා සහායකයින් සැපයීමෙන් සභා ගර්භයට සහය සේවා ලබා දීම.

- සභාවේ රැස්වීම් පැවැත්වෙන සෑම දිනයකම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පැමිණීම වාර්තා කිරීම / සහතික කිරීම.

- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය අනුව ලැයිස්තු සකස් කිරීම.

**ආරක්ෂාව**

- ආරක්ෂාවට අදාළ කරුණු සම්බන්ධයෙන් කථානායකතුමා සහ පාර්ලිමේන්තුවේ මහලේකම්තුමා හට උපදෙස් ලබා දීම.

- ජනාධිපතිතුමා සහ අග්‍රාමාත්‍යතුමා පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ රැඳී සිටින කාලය තුළ ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීම සහ අදාළ විධිවිධාන අධීක්ෂණය.

- පාර්ලිමේන්තුවේ සභා ගර්භයේ, සභා ගර්භයේ සීමාවේ, අනෙක් අංශවල සහ සබැඳි ප්‍රදේශවල ආරක්ෂාව තහවුරු කිරීම.

- ආහාර විෂවීම් වළක්වාලීමට පරීක්ෂණ පැවැත්වීම හා ඊට අදාළ කරුණු සොයා බැලීම.

- සභාව සඳහා නිසි ආරක්ෂාවක් නිසි පරිදි එහෙත් බාධාවක් නොවන පරිදි සැපයීම.

- කථානායකතුමාගේ නියෝග මත පාර්ලිමේන්තු සංකීර්ණය තුළ වීඩියෝගත කිරීම සහ ඡායාරූපකරණය පාලනය කිරීම.

- පාර්ලිමේන්තුවේ ආරක්ෂාව සම්බන්ධයෙන් පාර්ලිමේන්තු පොලිස් කොට්ඨාසය හා සහයෝගයෙන් ක්‍රියා කිරීම.

- කථානායකතුමාගේ ප්‍රධානත්වයෙන් සහ යුද, ගුවන්, නාවික, පොලිස් සහ බුද්ධි අංශවල සහභාගීත්වයෙන් ආරක්ෂක රැස්වීම් සංවිධානය කිරීම සහ පාර්ලිමේන්තුවේ ආරක්ෂාව පිළිබඳව එම ආයතන සමග සම්බන්ධීකරණයක් පවත්වා ගැනීම.

- පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ යතුරු (දළ වශයෙන් 1000ක් පමණ) නඩත්තුව / කළමනාකරණය.

- පාර්ලිමේන්තු සංකීර්ණය ආසන්නයේ / පිටත පරිමිතයේ පැවැත්වෙන විවිධ මහජන උත්සව සඳහා අවසර ලබා දීම.

- පාර්ලිමේන්තු සංකීර්ණයේ හා යාබද අංශවල සේවය කරන සේවකයන්ගේ ආරක්ෂක නිශ්කාශනයට අදාළ කටයුතු පිළිබඳ සොයා බැලීම.

- පිට අය ඉවත් කිරීමට හා සභාවට අනිසි පරිදි ප්‍රවේශ වන හෝ විෂමාචාරී ලෙස හැසිරෙන පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට හෝ ඉවත්කිරීමට හෝ අදාළ විධිවිධාන පාලනය සහ නියාමනය.

- **අවසර පත්‍ර නිකුත් කිරීම්**

  - රාජ්‍ය නිලධාරීන්ගේ කුටි සඳහා වන අවසර පත්‍ර

  - රාජ්‍ය නිලධාරීන් සඳහා වන අවසර පත්‍ර

  - කැබිනට් අමාත්‍යවරුන්ගේ පුද්ගලික ලේකම්වරුන් / ප්‍රධාන ආරක්ෂක නිලධාරීන් සඳහා වන අවසර පත්‍ර

  - භෝජනාගාර සඳහා වන අවසර පත්‍ර

  - වෙනත් කාර්ය මණ්ඩල / අනියම් කාර්ය මණ්ඩල / සැපයුම්කරුවන් සඳහා වන තාවකාලික ඇතුළු වීමේ අවසර පත්‍ර

  - පාර්ලිමේන්තු සංකීර්ණයේ සේවය කරන කාර්ය මණ්ඩලය ද ඇතුළුව අනුමත කළ කාණ්ඩ සඳහා වන වාහන අවසර පත්‍ර

  - පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ රියදුරන් සඳහා වන අවසර පත්‍ර

  - ජනමාධ්‍ය වාර්තාකරුවන් සහ ජනමාධ්‍ය ආයතනවල පණිවුඩකරුවන් සඳහා වන අවසර පත්‍ර

- රාජ්‍ය නිලධාරින් සහ අමුත්තන් සඳහා වන තාවකාලික වර්ණ අවසර පත්‍ර (මහල / ප්‍රදේශය අනුව)

- රැස්වීම් දින සඳහා වන මහජන ගැලරි අවසර පත්‍ර සහ විශේෂ අමුත්තන් සඳහා වන ගැලරි අවසර පත්‍ර

- පාර්ලිමේන්තුවේ සංචාරය / නැරඹීම සඳහා ඇතුළු වීමට අවසර ලබා දෙන ලිපි.

- විවිධ අමාත්‍යාංශවල / දෙපාර්තමේන්තුවල ලිපි බෙදාහැරීමේ සේවකයන් සඳහා ඇතුළු වීමට අවසර ලබා දෙන ලිපි.

- ප්‍රවේශ (ගේට්ටු) අවසර පත්‍ර

- ජංගම දුරකථන, විද්‍යුත් / ඉලෙක්ට්‍රොනික උපාංග සහ මාධ්‍ය උපකරණ සඳහා වන අවසර පත්‍ර

- නිවාඩු දින ඇතුළු රාජකාරි වේලාවෙන් බැහැර වේලාවන්වලදී ද කටයුතු කිරීමට අවසර ලබා දෙන ලිපි.

- පාර්ලිමේන්තු / වෙනත් කාර්ය මණ්ඩලවල නිලධාරීන් සඳහා වන මැදිරි අවසර පත්‍ර

- සභා ගර්භය / ආලින්ද සඳහා වන අවසර පත්‍ර

- මතු කියැවෙන පුද්ගලයන් සඳහා පාර්ලිමේන්තු හැඳුනුම්පත් නිකුත් කිරීම -

    - පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්
    - හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්
    - පාර්ලිමේන්තුවේ ගරු සේවයේ නියුතු නිලධාරීන්
    - පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාගේ කාර්ය මණ්ඩලය
    - පාර්ලිමේන්තුවේ සෙසු කාර්ය මණ්ඩල
    - පාර්ලිමේන්තුවේ අනුබද්ධිත කාර්ය මණ්ඩල
    - පාර්ලිමේන්තු පොලීසිය / පාර්ලිමේන්තු ජනමාධ්‍යවේදීන්
    - පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාගේ කාර්ය මණ්ඩලයේ විශ්‍රාමික සේවකයින්

- පාර්ලිමේන්තු සීමාවට අදාල භූමියේ වාහන නැවැත්වීම පාලනය කිරීම.

- ගිනි නිවීම් උපකරණ නඩත්තුව, ගිනි නිවීම් පෙරහුරු හා අභ්‍යාස ක්‍රියාත්මක කිරීම.

- එක්ස් කිරණ පද්ධතියේ නඩත්තු කිරීම්වලට අදාල කටයුතු

- පාර්ලිමේන්තුව විසින් සංවිධානය කරනු ලබන ජාත්‍යන්තර සමුළු, සම්මන්ත්‍රණ වැනි උත්සව වලදී උත්සවීය කටයුතු සහ ආරක්ෂාව හා සබැඳි සියළු කාර්යයන් ඉටු කිරීම.

- නිවාඩු දින ඇතුළුව වැඩ නොකරන වේලාවන් වලදී පාර්ලිමේන්තු සංකීර්ණයට අහඹු ලෙස පැමිණීම සහ නිවාඩු දින වලදී සහ කාර්යාල වේලාවෙන් පසුව පාර්ලිමේන්තු සංකීර්ණයේ හදිසි තත්ත්වයන්හිදී අවශ්‍ය කටයුතු කිරීම.

**අමුත්තන් පරිපාලනය**

- පාර්ලිමේන්තු සංකීර්ණයට පුද්ගලයන් ඇතුළු කිරීම පාලනය සහ නියාමනය කිරීම.

- මාධ්‍ය වාර්තාකරුවන්ගේ සහ අනෙකුත් ගැලරිවලට පුද්ගලයන් ඇතුළු කිරීම පාලනය සහ නියාමනය කිරීම.

**ඉඩ පහසුකම් සැලසීම**

- කාරක සභා කාමර, සම්මුඛ සාකච්ඡා කාමර, ගැලරි ආදිය වෙන් කිරීම් සේවා.

- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහ දෙපාර්තමේන්තු ඉඩ පහසුකම් පරිපාලනය කිරීම.

- ගොඩනැගිල්ලේ තත්ත්වය සහ අදාල මාර්ගෝපදේශ අනුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහ සහායක සේවා කාර්ය මණ්ඩලය ඇතුළු පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට ඉඩ පහසුකම් සැලසීම.

- අමාත්‍යවරුන් සහ දේශපාලන පක්ෂ නායකයන් ආදීන්ට කාමර වෙන් කර දීම.

- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහ දෙපාර්තමේන්තුවලට අනුයුක්ත නිල ඇඳුම් කාර්ය මණ්ඩලයට ලොකර්/කබඩ් වෙන්කර දීම.

**දෙපාර්තමේන්තු**

- ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තා සහ අනෙකුත් අදාල වාර්තා, ලියවිලි, රැස්වීම් කාර්ය සටහන්, ලිපි යනාදිය පිළියෙල කිරීම.

- පාර්ලිමේන්තුවේ ගෘහ භාණ්ඩ සහ උපාංග ආරක්ෂා සහිතව තබා ගැනීමේ වගකීම ඉසිලීම.

- කථානායක වරයාගේ සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ මෙහෙයවීම මත විධිමත් අවමංගල්‍ය උත්සව වෙනුවෙන් මල් වඩම් ඇණවුම් කිරීමට කටයුතු සැලැස්වීම.

- ප්‍රදර්ශන පුවරු ආදිය සම්බන්ධ කටයුතු.

- සභාව සහ එහි මන්ත්‍රීවරුන් පිළිබඳව කලට වේලාවට සහ නිවැරදිව තොරතුරු සැපයීම.
- පාර්ලිමේන්තු වාර්තා වැඩසටහන් හා සබැඳි කටයුතු.
- පහත සඳහන් කාර්ය මණ්ඩලයේ සමස්ත පාලනය සහ කළමනාකරණය (සංඛ්‍යාව 140) -
    - නියෝජ්‍ය වේත්‍රධාරී (01)
    - සහකාර වේත්‍රධාරී (01)
    - වේත්‍රධාරී දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන් (05)
    - ප්‍රවේශ පාලන හා ආරක්ෂක කාර්යාලයට අනුයුක්ත නිලධාරීන් (01)
    - දුරකථන අධීක්ෂක (01)
    - ආරච්චි (01)
    - පිළිගැනීමේ නිලධාරීන් (17)
    - එක්ස්-කිරණ පරීක්ෂකවරුන් (08)
    - දුරකථන ක්‍රියාකරුවන් (09)
    - ආරක්ෂක නිලධාරීන් (15)
    - පාර්ලිමේන්තු සේවා සහායකයන් (77)
    - ගෘහ භාණ්ඩ ඔප දමන්නන් (04)
- ගැලරි අවසරපත්, අනෙකුත් අවසර පත්, ආකෘති පත්‍ර ආදී දෙපාර්තමේන්තුව හා සබැඳි සියළු මුද්‍රණ කටයුතු
- දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටින කාර්ය මණ්ඩලයේ වැටුප් වර්ධක, උසස් වීම්, පුහුණු පහසුකම් නිර්දේශ කිරීම සහ ලබා දීම.
- පාර්ලිමේන්තු සේවා සහායක මිනිස් බල සහාය අනෙකුත් කාර්යාලවලට සැපයීම.
- දෙපාර්තමේන්තුව තුළ ඉන්වෙන්ට්‍රි පාලනය.
- දෙපාර්තමේන්තුවේ වාර්ෂික ඇස්තමේන්තු කෙටුම්පත් පිළියෙල කිරීම.
- තාවකාලික වර්ණ අවසරපත් සැලසුම් කිරීම, මුද්‍රණය සහ නිකුත් කිරීම.
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ පැමිණීම තහවුරු කිරීම.
- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඡායාරූප පාර්ලිමේන්තු වෙබ් අඩවියට සහ කාර්ය මණ්ඩලයේ ඡායාරූප පාර්ලිමේන්තු අන්තර්ජාල බිහිදොරට උඩුගත කිරීම.
- පාර්ලිමේන්තුවට උපකරණ/ගබඩා සහ අනෙකුත් ද්‍රව්‍ය/සේවා මිළදී ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් පත් කරනු ලබන ටෙන්ඩර් මණ්ඩල වල සභාපති, සාමාජිකයකු ලෙස කටයුතු කිරීම.

- දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටින කාර්ය මණ්ඩලයට කලින් කලට අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම.

- පිළිගැනීමේ නිලධාරීන්, එක්ස් - කිරණ පරීක්ෂකයන්, දුරකථන ක්‍රියාකරුවන් සහ ආරක්ෂක නිලධාරීන් වෙනුවෙන් මාසික වැඩ වාර සටහන පිළියෙල කිරීම.

- පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා සමග රැස්වීම් ඇතුළුව කාර්ය මණ්ඩල රැස්වීම් සඳහා කලින්කලට කටයුතු සැලැස්වීම සහ එබඳු රැස්වීම් පැවැත්වීම.

- සිහිවටන අලෙවිහල/ගබඩා පාලනය සහ කළමනාකරණය

- ලිපිගොනු සූචිය නඩත්තු කිරීම, රාජකාරි පැවරීම සහ රාජකාරි ලැයිස්තු/වැඩ වාර සටහන් සහ ඒ හා සබැඳි සංශෝධන දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටින කාර්ය මණ්ඩලයට කලින්කලට නිකුත් කිරීම.

- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ලොකර් ඇතුළුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ බිලියඩ් කාමරය පාලනය සහ කළමනාකරණය.

- කාර්ය මණ්ඩල පිවිසුමේ පිළිගැනීමේ කවුන්ටරයට දිනපතා ලැබෙන තැපැල, ලිපි, පුවත්පත් යනාදිය තේරීම සහ බෙදා හැරීම මෙහෙයවීම/අධීක්ෂණය

- පාර්ලිමේන්තු සංකීර්ණය තුළ සියළු ගෘහ භාණ්ඩ ඔප දැමීමේ වැඩ.

- කථානායකතුමාට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, කාර්ය මණ්ඩලය ආදීන් වෙනුවෙන් කලට වේලාවට සහ කාර්යක්ෂමව දුරකථන සේවා සැපයීම.

- ඉවත දමන කඩදාසි/සංයුක්ත තැටි/ඩී.වී.ඩී. බැහැර කිරීම සඳහා පහසුකම් සැපයීම.

- නිවාඩු දින ඇතුළුව වැඩ කරන පැය නොවන වේලාවන්හිදී සේවය සඳහා ආරක්ෂක නිලධාරීන් සහ අදාල කාර්ය මණ්ඩලය යෙදවීම.

- වේත්‍රධාරී දෙපාර්තමේන්තුව, සම්බන්ධීකරණ ඉංජිනේරු දෙපාර්තමේන්තුව, පරිපාලන දෙපාර්තමේන්තුව, හැන්සාඩ් දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තුවලට අනුයුක්තව සිටින නිලඇඳුම් අඳින කාර්ය මණ්ඩලයේ නිල ඇඳුම් පිරිසිදු කිරීම හා සම්බන්ධ කටයුතු

- ලබාගත් මිළදී ගැනීම්/සේවාවලට අදාල බිල්පත් ගෙවීම නිර්දේශ කිරීම සහ අනුමත කිරීම.

- දෙපාර්තමේන්තු විමර්ශනවලදී පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් පත් කරනු ලබන විමර්ශන නිලධාරී/චෝදනා ඉදිරිපත් කිරීමේ නිලධාරී ලෙස සේවය කිරීම.

## වේත්‍රධාරී දෙපාර්තමේන්තුවේ සංයුතිය

| | |
|---|---|
| ගෘහ භාණ්ඩ ඔප දමන්නන් | 04 |
| පාර්ලිමේන්තු සේවා සහයකයන් | 77 |
| ආරක්ෂක නිලධාරීන් | 15 |
| එක්ස්-කිරණ පරීක්ෂකයන් | 08 |
| පිළිගැනීමේ නිලධාරීන් | 17 |
| දුරකථන ක්‍රියාකරුවන් | 09 |
| දුරකථන අධීක්ෂක | 01 |
| ආරච්චි | 01 |
| ප්‍රවේශ පාලන හා ආරක්ෂක කාර්යාලය | 01 |
| කාර්යාලය | 05 |
| සහකාර වේත්‍රධාරි | 01 |
| නියෝජ්‍ය වේත්‍රධාරි | 01 |
| වේත්‍රධාරි | 01 |

# වේත්‍රධාරී දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



ඇමුණුම ''අ''

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 වගන්තියෙහි උධෘතයකි.**

**10 පරිච්ඡේදය. ව්‍යවස්ථාදායකය - පාර්ලිමේන්තුව**

**65(3) වගන්තිය - පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය පත්කිරීම.**

පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා

[42][65. (1) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයෙක් වන්නේය. මහ ලේකම්වරයා ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව පත්කරනු ලබන්නේය. මහ ලේකම්වරයා යථා පැවැත්මෙන් සිටිනා තාක් ස්වකීය ධූරය දරන්නේය.]

(2) මහ ලේකම්වරයාගේ වැටුප පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුත්තේය. එසේ නිශ්චය කරන ලද වැටුප ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේය. ඔහුගේ ධූර කාලය තුළ එකී වැටුප අඩු නොකළ යුත්තේය.

**(3) මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලය කථානායකවරයාගේ අනුමැතිය ඇතිව මහ ලේකම්වරයා විසින් පත් කරනු ලබන්නේය.**

(4) මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ වැටුප් ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේය.

(5) මහ ලේකම්වරයා -

(අ) මියගියහොත් එවිට; හෝ

(ආ) ජනාධිපතිවරයා වෙත යවන ලිපියක් මගින් ඉල්ලා අස් වුවහොත් එවිට; හෝ

(ඇ) පාර්ලිමේන්තුව විසින් නීතියෙන් අන්‍යාකාර විධිවිධාන සැලැස්වුවහොත් මිස, වයස අවුරුදු හැට සම්පූර්ණ කළ විට; හෝ

(ඈ) රෝගාතුර වීම නිසා හෝ ශාරීරික නැතහොත් මානසික දුර්වලතාවයක් නිසා හෝ ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබුවහොත් එවිට; හෝ

(ඉ) පාර්ලිමේන්තුව විසින් සම්මත කොට ඉදිරිපත් කරන යෝජනාවක් අනුව ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබුවහොත් එවිට; හෝ

මහලේකම් ධූරය හිස් වන්නේය.

[43][ (6) මහ ලේකම්වරයාට සිය ධූරයේ කටයුතු ඉටු කිරීමට නොහැකි වූ විට මහ ලේකම්වරයා වෙනුවෙන් වැඩ බැලීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව තැනැත්තකු පත් කිරීමට ජනාධිපතිවරයාට බලය තිබිය යුත්තේය.]

**1949 ජනවාරි මස 11 වන දා හැන්සාඩ් වාර්ථාවෙහි උධෘතයකි.**

**පිටු 763 සහ 764**

**බ්‍රිතාන්‍ය මහජන මන්ත්‍රී මණ්ඩලය විසින් සෙංකෝලය හා මූලාසනය පිළිගැන්වීම.**

Annexure "B"

**An Extract of the Hansard of the 11th January, 1949**

**Pages – 763 and 764**

Re :**Presentation of Chair and Mace from the House of Commons**

763 Presentation of Chair & Mace 11 JANUARY 1949 from House of Commons 764

HOUSE OF REPRESENTATIVES

*Tuesday 11th January, 1949.*

The House met at 2 p.m., Mr. SPEAKER [THE HON. MR. A. F. MOLAMURE] in the Chair.

OATH OF ALLEGIANCE.

Dr. V. R. Schokman (Appointed Member) took and subscribed the Oath of Allegiance required by law; and signed the Book at the Table.

PRESENTATION OF CHAIR AND MACE FROM THE HOUSE OF COMMONS

**The Serjeant at Arms:** Mr. Speaker, I have to report that a Delegation sent by the Commons House of Parliament of Great Britain and Northern Ireland to present a Speaker's Chair and a Mace to the House of Representatives, Ceylon, is inquiring if this Honourable House would be pleased to receive them.

**Mr. Speaker:** Is it the wish of the House that the Delegation be admitted?

**Hon. Members:** Aye!

**Mr. Speaker:** Yes, admit them, please.

The Delegation, consisting of:—

Major The Right Hon. James Milner, M.C., T.D., D.L., LL.B., M.P., Deputy Speaker, House of Commons;

Major The Right Hon. G. Lloyd George, M. P.;

Captain L. D. Gammans, M. P.;

T. W. Burden, Esq., C.B.E., M.P.;

attended by—

E. A. Fellowes, Esq., C.B., M.C., Clerk Assistant, House of Commons; and

C. J. Harris, Esq., C.B.E.

were admitted to the Bar by the Serjeant at Arms.

**The Serjeant at Arms:** Mr. Speaker, the Delegation from the House of Commons.

**Mr. Speaker:** I welcome you, Gentlemen, on behalf of this House. Pray be seated.

[The Delegation having taken their seats]—

2.05 P.M.

**Mr. Speaker:** Hon. Members of the House of Representatives, and hon. Members of the Delegation from the British House of Commons.—It is with feelings of sincere friendship that I, as the mouthpiece of this House, welcome you Gentlemen from across the seas. The gesture of the House of Commons in presenting this House with the two symbols of dignity and authority we welcome and appreciate, the more so, because we realise that gesture emanated from the feelings of high regard and esteem which you Members of the Mother of Parliaments bear towards us, the youngest Parliament of a free and independent country.

The Speaker's Chair, as you well know, stands for the majesty and dignity of the House. In itself—a vacant emblem—but yet, inspiring feelings of restraint and obedience, it is the structure which lends majesty to the House. The Chair, which you are about to present, is an imposing one, and I am sure will always be looked upon with feelings of affection and dignified esteem.

As for the Mace, every one will admit that it is a thing of beauty, designed and carried out by your craftsmen on lines indicated by us. Each emblem in it has some particular meaning for us of the East. In short, the various emblems denote Purity, Perpetuity, Progress, Plenty and Prosperity, and the whole of it denotes the power and authority not only of the Chair, but also of this House, to safeguard the rights and privileges which are the heritage of a democratic institution such as our House is.

I have no doubt that every Member of this House, whether he be here or not, will pay that respect, regard and honour due to these two emblems which must necessarily remind hon. Members of this House of their solemn duty, and the great traditions which they have undertaken to uphold.

I must not say more, but conclude by adding my personal appreciation and thanks to the Resolution of thanks which will be moved now.

Once again, on behalf of the House, I offer you, Gentlemen, a very cordial welcome.

ඇමුණුම ''ඇ''

# සෙංකෝලය

පාර්ලිමේන්තුවේ බල අධිකාරියේ සංකේතය වන සෙංකෝලය මහා බ්‍රිතාන්‍යයේ හා උතුරු අයර්ලන්ත මහජන මන්ත්‍රී මණ්ඩලය විසින් 1949 ජනවාරි මස 11 වැනිදා ලංකාවේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙත ප්‍රදානය කරන ලදී. නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ නියෝජ්‍ය කථානායක මේජර් මහාමාන්‍ය ජේම්ස් මිල්නර් මහතා ප්‍රමුඛ දූත පිරිසක් "සෙංකෝලය" එවකට වේත්‍රධාරී එම්. ඉස්මයිල් මහතා එම්.බී.ඊ වෙත, එවකට මහජන මන්ත්‍රී මණ්ඩලයේ කථානායක ෆ්‍රන්සිස් මොලමුරේ මහතා මුලසුන දරන ලද රැස්වීමක දී ප්‍රදානය කරන ලදී. සෙංකෝලය අබිමුව තබා සභාව රැස්වූ ප්‍රථම අවස්ථාව එයයි.

සෙංකෝලයේ වටිනාකම එම දිනට වූයේ බ්‍රිතාන්‍ය පවුම් දෙදහස් පන්සීයකි. එහි බර රාත්තල් 28ක් වන අතර දිගින් අඟල් 48 වේ. සෙංකෝලයේ මෝස්තරය, කොළඹ තාක්ෂණ විද්‍යාලයෙහි ලලිත කලා දෙපාර්තමේන්තුවෙහි සේවය කළ එස්. පී. චාර්ල්ස් හා ඔහුගේ සගයන් විසින් අඳින ලද සිතුවම් මත පදනම් ව තිබේ. මෙම මෝස්තරයට සම්බන්ධ පුරානෝක්තිය එවකට පුරාවිද්‍යා කොමසාරිස් ආචාර්ය සෙනරත් පරණවිතාන මහතා විසින් අනුමත කරන ලදී. සෙංකෝලය නිර්මාණය කරන ලද්දේ බකිංහැම් මාලිගයට ආභරණ සපයන එංගලන්තයේ එම් එස් ගැරඩ්ස්(පෞද්.) සමාගමෙහි ප්‍රසිද්ධ රන්කරු ඩැනියෙල් ස්පෙන්සර් මහතා විසිනි. සෙංකෝලයෙහි ඇති කලුවර ලී කැබැල්ල හා නිල් මැණික් ශ්‍රී ලංකාවෙන් සපයන ලද බව වාර්තා වේ.

මෙහි මෝස්තර පුරාතන ලංකාවේ පන්සල් ආශ්‍රිත ගෘහ නිර්මාණ ශිල්පය මත හා අලංකරණය නෙළුම් මලෙහි රටාවන් මත සිදුව ඇත. විවෘත නෙලුම් මල සදාකාලිකත්වය හා රමණීයත්වය ද වැසුනු නෙලුම් මල පරිසමාප්ත ශාන්තිය පිළිබිඹු කරයි.

සෙංකෝලය රිදියෙන්, කැරට් 18 රත්‍රන් හා නිල් මාණික්‍යයෙන් වැඩ දමා ඇති කළුවර ලී යෂ්ටියකින් නිමවා ඇත. පහත කොටස රත්තරනින් හා රිදියෙන් කැටයම් කළ යටිකුරු නෙළුම් මලකින් සමන්විත වන අතර පළමු සැරසිලි ගැටයට ද රන් පටි දෙකකින් කැටයම් කරන ලද නෙළුම් මලක් අන්තර්ගත වේ. ඊට ඉහලින් අෂ්ඨශ්‍රාකාර රිදී සැරසිලි ගැටයක් මතුයෙහි වූ වඩා දිගු රාමු කරන ලද රන් පටියකට ආධාර වන නිල් මැණික් වළල්ලකි. අනෙක් අතින් මෙය පොළොවෙහි හතර දෙස නියෝජනය වන රිදියෙන් හා කැරට් 18 රනින් කළ කොටස් හතරකට ආධාර වන අතර ඉන් නිල්මිණි හා රන් බිඳු කඩා හැලෙන ආකාරයක් පෙන්වා ඇත. මීට (ජේකඩට) ඉහළින් සිව්රැස් සණකයක් ඇත. එහි පැති හතරේ හිරු මඬල, සඳ මඬල, ධර්ම චක්‍රය හා පූර්ණ ඝට (සෞභාග්‍යය සලකුණු කරන මල්බඳුන) දර්ශණීය ලෙස කැටයම් කර ඇත. එම කැටයම් වලින් සදාතනිකත්වය, සාධාරණත්වය, සෞභාග්‍යය හා සමෘද්ධිය සංකේතවත් වේ. එම ඝටය මුදුනේ ඇති රන්මුවා පද්මය මත අඟල් 6 ක විශ්කම්භයක් ඇති රිදී ගෝලයක් සවි වී ඇත. එම ගෝලය දෙපැත්තේ අසිපත් දරා සිටින සිංහ රූප දෙකක් උත්තලව දක්වා ඇත. මෙය රත්තරනින් කැටයම් කර ඇත. මෙම ගෝලය මත නෙළුම් පෙති කැටයමකි. ඊට උඩින් පද්ම කැටයමකි. ඊට ඉහළින් නීල මාණික්‍යයෙන් සැරසූ වළල්ලක් ද, ඊට ඉහළින් ඔප දමන ලද අට පට්ටම් පළිඟුමය කේතුවක් ද ඇත.

සෙංකෝලය පාර්ලිමේන්තු බල අධිකාරියේ සංකේතයක් ලෙස ද, පාර්ලිමේන්තුව තුළින් කථානායකවරයාගේ බල අධිකාරියේ සංකේතයක් ලෙස ද පැවතී ඇති බැවින්, පාර්ලිමේන්තුවට සෙංකෝලය නොමැතිව රැස්විය නොහැකි වේ. කථානායකවරයා පාර්ලිමේන්තුවේ කථානායක අසුනේ අසුන්ගෙන සිටින විට පාර්ලිමේන්තුව රැස්වෙන අවස්ථාවක් වන අතර වේත්‍රධාරි විසින් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ මේසයට කෙළින්ම පහළින් පිහිටා ඇති මේසය මත වූ ආධාරකයක් මත ආණ්ඩු පක්ෂයේ ආසන දෙසට එහි අශ්ටාශ්‍ර හැඩති පලිගු අග්‍රය යොමුවන පරිදි සෙංකෝලය තැන්පත් කර තබනු ලැබේ. කථානායකවරයා කථානායක අසුනින් ඉවත් වී කාරක සභා අවස්ථාවකට පැමිණි විට පාර්ලිමේන්තුව නිසි පරිදි රැස්නොවන බව පෙන්වීම පිණිස සෙංකෝලය පාර්ලිමේන්තු මේසයෙහි පහළ ආධාරකය මත තබනු ලැබේ.

විශේෂයෙන්ම කථානායකවරයා තෝරා පත්කර ගැනීම ද ඇතුළු පාර්ලිමේන්තු උත්සව ගණනාවක දී සෙංකෝලය අත්හල නොහැකි අංගයකි. සෙංකෝලය නොමැතිව එම තෝරාපත් කරගැනීම කළ නොහැක.

මහ මැතිවරණයකින් පසුව පැවැත්වෙන ප්‍රථම පාර්ලිමේන්තුවේ රැස්වීමේදී වේත්‍රධාරිවරයා විසින් සෙංකෝලය සභාව වෙත රැගෙන එන අතර සෙංකෝලය පහළ ආධාරකය මත තැන්පත් කර තැබීමට වේත්‍රධාරි වගබලා ගනී. අනතුරුව කථානායකවරයා තේරී පත් වී කථානායක අසුනේ අසුන් ගන්නා මොහොතේ වේත්‍රධාරි විසින් සෙංකෝලය ඉහළ ආධාරකයේ තැන්පත් කරනු ලබයි.

සභා ගර්භයට පැමිණීමේ දී හා පිටවීමේ දී, සිය දකුණු උරයෙන් සෙංකෝලය දරාසිටින නියෝජ්‍ය වේත්‍රධාරිවරයා පෙරටු කොටගත් වේත්‍රධාරිවරයා පසුපසින් කථානායකවරයා ගමන් කරන අතර පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා සහ ඔහුගේ හෝ ඇයගේ නියෝජ්‍ය මහ ලේකම්වරුන් කථානායකවරයා පසුපසින් ගමන් කරයි. නියෝජ්‍ය වේත්‍රධාරිවරයා විසින් කථානායකවරයා සභා ගර්භයට පැමිණීම නිවේදනය කරයි.



# සෙංකෝලයේ සැකැස්ම



# පාර්ලිමේන්තුව තුළ විනය

## පාර්ලිමේන්තු ස්ථාවර නියෝග (ස්.නි. 77-80) උද්ධෘතයකි

77. (1) යම් මන්ත්‍රීවරයෙකු මූලාසනයේ අධිකාරිය නොතැකීම හෝ නිරන්තරයෙන් ම හිතාමතා ම හෝ අන්‍යාකාරයෙන් පාර්ලිමේන්තුවේ වැඩකටයුතුවලට බාධා කිරීම මගින් පාර්ලිමේන්තුවේ රීති අනිසි ලෙස භාවිතා කිරීමේ වරද කරනු ලැබූ විගස ම කථානායකවරයා විසින්, එම මන්ත්‍රීවරයා නම් කරනු ලැබූ කවර හෝ අවස්ථාවක දී "එම මන්ත්‍රීවරයාගේ පාර්ලිමේන්තු සේවය අත්හිටවනු ලැබිය යුත්තේ ය" යනුවෙන් කරන ලද යෝජනාවක් මත (කිසිම සංශෝධනයකට කල් තැබීමකට හෝ විවාදයකට ඉඩ ලබා නොදී) කථානායකවරයා විසින් ප්‍රශ්නය වහා ම විමසනු ලැබිය යුත්තේය.

(2) එවැනි යම් යෝජනාවක් සම්මත වී මෙම ස්ථාවර නියෝගය යටතේ යම් මන්ත්‍රීවරයකුගේ පාර්ලිමේන්තු සේවය අත්හිටවනු ලැබ ඇත්නම්, එසේ එම මන්ත්‍රීවරයාගේ සේවය අත්හිටවීම පළමු අවස්ථාවේ දී සති දෙකකට ද, එම සභා වාරයේ ම දෙවැනි අවස්ථාවේ දී සති තුනකට ද, එම සභා වාරයේ ම තෙවැනි හෝ ඊට පසුව එළඹෙන කවර හෝ අවස්ථාවක දී සති හතරකට ද වශයෙන් විය යුත්තේය.

එසේ වුව ද, පාර්ලිමේන්තු සේවය අත්හිටවනු ලැබ ඇත්තේ කවර මන්ත්‍රීවරයකුගේ ද, එම මන්ත්‍රීවරයාට එම අත්හිටවනු ලැබීම බලපැවැත්වෙන කාලසීමාව තුළ දී විසර්ජන පනත් කෙටුම්පතේ අවසන් ඡන්ද විමසීමේ දී පමණක් ඡන්දය භාවිතා කරනු ලැබීමට කථානායකවරයා විසින් අවසර ලබා දෙනු ලැබිය හැකි ය.

(3) ඉහත (1) වැනි සහ (2) වැනි ඡේදවල විධිවිධානයන්හි කුමක් සඳහන්ව තිබුණ ද, සෙංකෝලය පාර්ලිමේන්තුවේ සභා ගර්භය ඇතුළත තබා ඇති අවස්ථාවක දී, එය ස්පර්ශ කිරීම හෝ එසවීම හෝ මගින් බරපතල විනය විරෝධී ක්‍රියාවක් සිදු කරනු ලබන යම් මන්ත්‍රීවරයකු විසින් එම වරද සිදු කරනු ලබනුයේ පළමුවරට යන කාරණය නොසලකා එම මන්ත්‍රීවරයාගේ පාර්ලිමේන්තු සේවය සති හතරකට අත්හිටවනු ලැබිය යුතුය.

(4) පැමිණ සිටින මන්ත්‍රීවරයන් කිහිප දෙනෙකු එක්ව මූලාසනයේ අධිකාරිය නොතකා ඇත්නම් මිස, එක ම අවස්ථාවේ දී එක් මන්ත්‍රීවරයකුට වඩා වැඩි දෙනෙකු නම් කිරීම කරනු නොලැබිය යුත්තේය.

(5) මෙම ස්ථාවර නියෝගය යටතේ පාර්ලිමේන්තු සේවය අත්හිටවනු ලැබ ඇති යම් මන්ත්‍රීවරයකු හෝ එක්ව ක්‍රියා කළ මන්ත්‍රීවරයන් හෝ එසේ සේවය අත්හිටවනු ලැබ ඇති කාල සීමාව තුළ පාර්ලිමේන්තු පරිශ්‍රයෙන් ඉවත් වීම සඳහා කථානායකවරයා විසින් කරනු ලබන විධානය පිළිපැදීම ප්‍රතික්ෂේප කරනු ලබයි නම්, කථානායකවරයා විසින් සිය විධානය බලාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීමට නියෝග කරනු ලැබිය හැකිය.

(6) මෙම ස්ථාවර නියෝගයේ (1) වැනි ඡේදය යටතේ වරදක් පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවක් තුළ දී කරනු ලැබුවහොත්, සභාපතිවරයා විසින් කාරක සභාවේ වැඩකටයුතු වහා ම අත්හිටවනු ලැබ සිද්ධියට අදාළ කරුණු පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුතු අතර, ඉන් අනතුරුව ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් මත, එම වරද පාර්ලිමේන්තුව තුළ දී කරන ලද්දාක් මෙන් සලකා, සංශෝධනයක්, කල් තැබීමක් හෝ විවාදයක් නොමැතිව කථානායකවරයා විසින් එම ප්‍රශ්නය විමසනු ලැබිය යුත්තේය.

78. විවාදයක දී, තමා විසින් ම කරන ලද හෝ වෙනත් මන්ත්‍රීවරයන් විසින් හෝ කරන ලද තර්ක නිරන්තරයෙන් අදාළ නොවන හෝ වෙහෙසකර ලෙස නැවත නැවතත් ප්‍රකාශ කිරීමෙහි යෙදෙන මන්ත්‍රීවරයකුගේ හැසිරීම කෙරෙහි පාර්ලිමේන්තුවේ සැලකිල්ල යොමු කරවනු ලැබ, එම මන්ත්‍රීවරයාගේ කථාව අඛණ්ඩව කරගෙන යෑම නවත්වන ලෙස සහ සජීවී විකාශය නවත්වන ලෙස කථානායකවරයා විසින් නියෝග කරනු ලැබිය හැකිය.

79. (1) බරපතල ලෙස විනය විරෝධීව හැසිරෙන මන්ත්‍රීවරයකුට එදින රැස්වීමේ ඉතිරි කොටස අවසන් වන තෙක් පාර්ලිමේන්තුවෙන් වහා ම ඉවත් වන ලෙස කථානායකවරයා විසින් නියෝග කරනු ලැබිය යුතු අතර, සිය නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට නියම කරනු ලැබිය හැකි ය. වෙත්‍රධාරීවරයා විසින් එම නියෝගය ක්‍රියාවේ යෙදවීම සඳහා කටයුතු කළ යුත්තේය.

(2) මෙම ස්ථාවර නියෝගය යටතේ සිය බලතල ප්‍රමාණවත් නොවේ යැයි කවර හෝ අවස්ථාවකදී කථානායකවරයා අදහස් කරන්නේ නම්, 77 වැනි ස්ථාවර නියෝගය ප්‍රකාරව එවැනි මන්ත්‍රීවරයන් නම් කරනු ලැබිය හැකි ය.

80. 77 වැනි ස්ථාවර නියෝගය ප්‍රකාරව සේවය අත්හිටවන ලද හෝ 79 වැනි ස්ථාවර නියෝගය ප්‍රකාරව පාර්ලිමේන්තුවෙන් ඉවත් වන්නට විධාන කරනු ලැබූ යම් මන්ත්‍රීවරයකු විසින් පාර්ලිමේන්තු භූමි භාගයෙන් වහා ම ඉවත් වනු ලැබිය යුතු අතර, එසේ අත්හිටවන ලද කාල සීමාව තුළ දී, කාරක සභාවලට සහභාගි වීමට ද එම මන්ත්‍රීවරයන්ට තහනම් විය යුත්තේය.

මෙම පරිච්ඡේදයේ කාර්ය සඳහා "පාර්ලිමේන්තු භූමි භාගය" යනුවෙන් පාර්ලිමේන්තු ගොඩනැගිලි සහ පාර්ලිමේන්තුවේ ගේට්ටු අංක 1 සිට ගේට්ටු අංක 3 දක්වා පරිශ්‍රය ද ඇතුළත් වන්නේය.

**පාර්ලිමේන්තු බලතල සහ වරප්‍රසාද පනතෙහි උධෘතයකි. (383 පරිච්ඡේදය)**

**ආ කොටස - පාර්ලිමේන්තුව විසින් හෝ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දඬුවම් කළ හැකි වැරදි.**

29. 28 වන වගන්තිය යටතේ අවවාද කිරීම සඳහා යම් තැනැත්තකු පාර්ලිමේන්තුවේ සභා ගැබ සීමාවට, පැමිණෙන බවට වග බලාගැනීමේ කාර්යය සඳහා නැතහොත් ඒ වගන්තිය යටතේ පාර්ලිමේන්තු භූමියෙන් ඉවත් කරන ලෙස නියම කරනු ලැබ ඇති යම් තැනැත්තකු නැතහොත් එම වගන්තිය යටතේ පාර්ලිමේන්තු භූමියට ඇතුළුවීම තහනම් කරනු ලැබ ඇති යම් තැනැත්තකු පාර්ලිමේන්තු භූමියෙන් ඉවත් කිරීමේ කාර්යය සඳහා සභාපතිවරයා විසින් හෝ කථානායකවරයා විසින්, අවස්ථාවෝචිත පරිදි ප්‍රවේශක නිලධරයා විසින් හෝ පාර්ලිමේන්තුවේ වෙනත් යම් නිලධරයකු විසින් හෝ පොලිස් නිලධරයකු විසින් හෝ ප්‍රවේශක නිලධාරියාට හෝ වේත්‍රධාරියාට හෝ පාර්ලිමේන්තුවේ වෙනත් යම් නිලධාරියෙකුට හෝ පොලිස් නිලධාරියෙකුට හෝ එසේ කරන ලෙස නියම කරනු ලැබුවහොත්, පාර්ලිමේන්තු භූමිය ඇතුළත යම් ස්ථානයක දී වරෙන්තුවක් නොමැතිව ඒ තැනැත්තා සිර භාරයට ගැනීම හා ඉහත කී කාර්යය සඳහා අවශ්‍ය විය හැකි සාධාරණ බලය යෙදීම නීත්‍යනුකූල වන්නේ ය.

ආ කොටස

**පාර්ලිමේන්තුව විසින් හෝ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දඬුවම් කළ හැකි වැරදි**

1. මේ පනත යටතේ පාර්ලිමේන්තුවේ යම් නියමයකට හෝ යෝජනා සම්මතයකට නැතහොත් මේ පනත යටතේ විධිමත් ලෙස කරන ලද සභාපතිවරයාගේ හෝ කථානායකවරයාගේ හෝ යම් මන්ත්‍රීවරයකුගේ නියමයකට අවනත වීම සිතාමතා පැහැර හැරීම හෝ ප්‍රතික්ෂේප කිරීම.

2. පාර්ලිමේන්තුව විසින් හෝ තත්කාර්ය සඳහා විධිමත් ලෙස බලය දෙනු ලැබූ යම් කාරක සභාවක් විසින් පැමිණීම සඳහා හෝ ලියවිලි, පොත්, වාර්තා, හෝ ලේඛන ඉදිරිපත් කිරීම සඳහා හෝ කරන ලද යම් නියමයකට පනතේ 13 වන වගන්තියෙන් හා 15 වන වගන්තියෙන් විධිවිධාන සැලැස්වෙන පරිදි පැමිණීමෙන් හෝ ඉදිරිපත් කිරීමෙන් නිදහස් කරනු ලැබුවහොත් මිස, සිතාමතා අවනත නොවීම.

3. 13 වන වගන්තියෙන් හා 15 වන වගන්තියෙන් විධිවිධාන සැලැස්වෙන පරිදි ප්‍රතික්ෂේප කිරීමට නිදහස ලැබී ඇත්නම් මිස පාර්ලිමේන්තුව ඉදිරියේ හෝ එවැනි යම් කාරක සභාවක් ඉදිරියේ ප්‍රශ්න කරනු ලැබීම හෝ පාර්ලිමේන්තුව හෝ කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන යම් නීත්‍යනුකූල වූත් අදාළ වූත් ප්‍රශ්නයකට පිළිතුරු දීම හෝ ප්‍රතික්ෂේප කිරීම.

4. පාර්ලිමේන්තුව තුළ දී හෝ කාරක සභාව තුළ දී හෝ පාර්ලිමේන්තු භූමිය තුළ දී යම් මන්ත්‍රීවරයකුට පහර දීම, නින්දා කිරීම හෝ සිතාමතා බාධා පැමිණවීම.

5. පාර්ලිමේන්තුවේ සභා ගර්භය තුළ දී හෝ කාරක සභාව තුළ දී හෝ පාර්ලිමේන්තු භූමිය තුළ දී පාර්ලිමේන්තුවේ නිලධරයකුට පහරදීම හෝ ප්‍රතිරෝධය පෑම නැතහොත් ඔහුගේ කටයුතුවලට සිතාමතා මැදිහත් වීම.

6. පාර්ලිමේන්තුව හෝ යම් කාරක සභාවක් රැස්ව සිටිය දී පාර්ලිමේන්තුවේ හෝ කාරක සභාවේ කටයුතුවලට බාධාවන බව හෝ බාධාවනු ලැබීමට ඉඩ ඇති බව දැනුවත්ව නැතහොත් විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබිය දී පාර්ලිමේන්තුවේ සභා ගර්භය තුළ හෝ කාරක සභාවක හෝ පාර්ලිමේන්තුව අවට යම් කලබලයක් ඇති කිරීම හෝ එහිලා හවුල්වීම.

7. පාර්ලිමේන්තු භූමිය තුළ ගරු සරු නැතිව හැසිරීම.

8. පාර්ලිමේන්තුව ඉදිරියේ හෝ කාරක සභාවේ දී සාක්ෂිකරුවකු වශයෙන් ඇත්ත සඟවා කථා කිරීම හෝ වෙනත් විෂමාචාරයක්.

9. පාර්ලිමේන්තුවේ කාරක සභාවක කටයුතු කිසිවක් පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීමට පෙර, ඒවා ප්‍රකාශනය කිරීම.

10. ඉහත සඳහන් ඡේද කිසිවක නිශ්චය කොට දක්වනු ලබන ක්‍රියාවකට හෝ නොකර හැරීමකට අනුබල දීම.

ඇමුණුම "ඊ"

**1973 නොවැම්බර් මස 14 වන බදාදා, ප.ව. 4.00 ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේ පැවති පක්ෂ නායක රැස්වීමේ කාර්ය සටහන්වලින් උධෘතයක්.**

''2. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලාගේ ඇඳුම් සම්බන්ධව මෑතක දී ප්‍රශ්නයක් පැනනැගී ඇති බව ගරු කථානායකවරයා පක්ෂ නායකවරුන්ට දැන්වීය. මෑතක සිට සමහර මන්ත්‍රීවරුන් රැස්වීම්වලට සහභාගී වීමේදී විවිධ වර්ගයේ ටියුනික් කර සහිත කබා අඳින බව එතුමා පැවසීය.

මන්ත්‍රීවරුන්ගේ ඇඳුම් පාර්ලිමේන්තු සභාවෙහි ශෝභනත්වය හා ගරුත්වය පවත්වා ගැනීමෙහිලා අනුල්ලංඝනීය අංගයක් වන හෙයින් ඇඳුම් පිළිබඳව මන්ත්‍රීවරුන් අනුගත විය යුතු යම් ප්‍රමිතිගත අවශ්‍යතාවයන් ඇති කිරීම අවශ්‍ය වන බව ද එතුමා කියා සිටියේය.

අනාගතයේ දී පහත දැක්වෙන මාදිලියේ ඇඳුම් පමණක් පාර්ලිමේන්තු සභා ගර්භය තුළ දී ඇඳීමට අවසර දියයුතු බව ගරු කථානායකවරයා යෝජනා කළේය.

(1) ජාතික ඇඳුම
(2) සාම්ප්‍රදායානුකූල ඇඳුම (පූර්ණ යුරෝපීය ඇඳුම)
(3) කලිසම හෝ රෙද්ද සමග බෙල්ල දක්වා පියවන ලද අත් දිග දිග ටියුනික් කොලරය සහිත කබාය

සභාව තුළ පිළිගත් ආගමික විශ්වාසයකට අදාළ වන්නේ නම් හැර කිසිම ආකාරයක හිස්වැසුම් පැළඳීමට ඉඩ නොදිය යුතු බව ද ඔහු පැවසීය.

සාකච්ඡා කිරීමෙන් අනතුරුව පක්ෂ නායකවරුන් ඉහත යෝජනාවන්ට එකඟ වූ අතර එළැඹෙන වසර ආරම්භයේ දී එම යෝජනා ක්‍රියාත්මක කළ යුතු බව තීරණය කරන ලදී.

ඉදිරියේ දී ගරු කථානායකතුමා විසින් මෙම කරුණ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අවධානයට ලක්කර ඔවුන්ගේ තීරණය ද ලබාගත යුතු බවට ද පක්ෂ නායකයන් එකඟ වන ලදී.''

**වත්මන් ඇඳුම**

(1973 නොවැම්බර් මස 14 පැවති පක්ෂ නායක රැස්වීමේ දී ගන්නා ලද තීරණය හා ඉන් පසු ගන්නා ලද තීරණ හා මෙතෙක් අනුගමනය කරන ලද සම්ප්‍රදායන් අනුව)

(1) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා ජාතික ඇඳුම/සම්පූර්ණ යුරෝපීය ඇඳුම/කලිසම හෝ රෙද්ද සමග බෙල්ල දක්වා පියවන ලද අත් දිග ටියුනික් කොලරය සහිත කබාය
(2) කාන්තා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා සාරිය සහ හැට්ටය
(3) ආගමික සිරිත් හා සම්ප්‍රදායන්ට අනුව පිළිගත් ඇඳුම්
(4) ආගමික සිරිත් හා සම්ප්‍රදායන්ට අනුව පිළිගත් හිස් වැසුම්
(5) මන්ත්‍රීවරුන් හැකි සෑමවිටම ලා පැහැ ඇඳුම් ඇඳිය යුතු අතර, තද පැහැති/වර්ණවත් හෝ ඉරි සහිත/චෙක් ඇඳුම් පාර්ලිමේන්තු සභාවට ඇඳීමෙන් වැළකිය යුතු ය.

**2018 සැප්තැම්බර් මස 4 වැනිදා පාර්ලිමේන්තු විවාදවල (හැන්සාඩ් වාර්තාව) උධෘතයකි. වෙලුම 263 - අංක 10 - පිටු 7.**

**පාර්ලිමේන්තුවේ වේත්‍රධාරීවරයා පත්කිරීම පිළිබඳ නිවේදනය.**

# ''නිවේදන''
# *அறிவிப்புகள்*
# ANNOUNCEMENTS

II

පාර්ලිමේන්තුවේ වේත්‍රධාරි පත්කිරීම

*(பாராளுமன்ற படைக்கலச் சேவிதர் நியமனம்)*

APPOINTMENT OF SERJEANT - AT - ARMS OF PARLIAMENT

ගරු කථානායකතුමා

*(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)*

(The Hon. Speaker)

''ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වේත්‍රධාරි තනතුර සඳහා නියෝජ්‍ය වේත්‍රධාරි නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා 2018 අගෝස්තු මස 30 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි පත් කරනු ලැබ ඇති බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි''.

**2018 අගෝස්තු මස 24 වැනිදා පාර්ලිමේන්තු විවාදවල (හැන්සාඩ් වාර්තාව) උධෘතයකි. වෙලුම 262- අංක 10 පිටු 1698 සහ 1699.**

1698

## ''කල් තැබීම''
## *(ஒத்திவைப்பு)*
## ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
*(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)*
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ''පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය'' යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

1699

## අනිල් පරාක්‍රම සමරසේකර මහතා: සේවය ඇගයීම
## *திரு. அனில் பராத்திரம சமரசேகர : சேவை பாராட்டு*
## MR. ANIL PARAKRAMA SAMARASEKERA : APPRECIATION OF SERVICE

(අ.භා. 6.21)

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
*(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)*
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

''මෙම පාර්ලිමේන්තුවේ වෛත්‍රධාරීවරයා වශයෙන් මෙම ගරු සභාව තුළ වසර 12ක පමණ කාලයක් සේවය කළ, පාර්ලිමේන්තුවේ සේවා කාලය වසර 22 ක් සම්පූර්ණ කර විශ්‍රාම ගන්නා අනිල් පරාක්‍රම සමරසේකර මහතා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට කරන ලද විශිෂ්ට සේවාව මෙම ගරු සභාව අගය කරන අතර, ඔහු විශ්‍රාම යන අවස්ථාවේ මෙම පාර්ලිමේන්තුව ඔහුට ශුභාශිංසනය කරයි''.

## ඉහළ මන්ත්‍රී මණ්ඩලයේ (සෙනේට් සභාවේ) සෙංකෝලය

1972 දක්වා පැවැති ඉහළ මන්ත්‍රණ සභාව (සෙනේට් සභාව) විසින් පරිහරණය කළ සෙංකෝලය ආණ්ඩුකාර ශ්‍රීමත් ඔලිවර් ගුණතිලක මහතා විසින් 1956 නොවැම්බර් මස 01 වැනි දින සෙනෙට් සභාව වෙත භාර දෙන ලදී.

ලලිත කලා ආයතනයේ ඩබ්ලිව්.ඒ. ආරියසේන මහතා විසින් සැලසුම් කළ බවට ප්‍රකාශිත මෙම සෙංකෝලය නිර්මාණය කිරීමේ කාර්යය එවක කොළඹ පිහිටි 'හේමචන්ද්‍ර සහෝදරයෝ' නමැති රන් භාණ්ඩ නිමැවුම් ආයතනයක් මගින් ඉටුකළ බව පැවසේ. එම ආයතනයේ උපදෙස් මත, රඹුක්කන, දොඹේගොඩ පදිංචි ඊ.එන්. පියතිලක නමැති ශිල්පියකු විසින් මෙම සෙංකෝලය නිමවා ඇත.

කොටස් 355 කින් සමන්විත මෙම සෙංකෝලය කොටස් හතළිහකට ගලවා වෙන් කළ හැකි අතර දිගින් අඟල් 52ක් සහ බරින් රාත්තල් 7 1/2කි. මෙම අගනා නිමැවුම සඳහා භාවිතා කළ අමුද්‍රව්‍ය අතර ප්‍රධාන වශයෙන් ඇත් දළ කොටස් දෙකක් ද, කැරට් 20ක් වූ රත්‍රන් පවුම් 45ක්, බරින් රාත්තල් 3 1/2 ක් වූ රිදී කොටස් 45ක් සහ මැණික් ගල් ගණනාවකින් සමන්විතය.

මෙම සෙංකෝලයේ ඉහළ කොටසේ ''සන්තින්ද්‍රියෝච නිපකෝච'' යන පාලි පාඨය කැටයම් කර ඇත.

## 1949 වසරේ සිට ''ජෙන්ට්ල්මෙන් අෂරර්'' තනතුර දැරූ නිලධාරින්

* වී.ටී. ඩික්මන් මහතා - 1949 ජූලි මස සිට 1958 ජූනි මස දක්වා
* මේජර් ඩබ්.පී.ජේ. සිල්වා මහතා - (එම්.බී.ඊ, සී.එල්.අයි) - 1958 ජූනි මස සිට 1959 ජූනි මස දක්වා.
* ලුතිනන් කොමාන්ඩර් එන්.පී.එස්. විජයවික්‍රම මහතා - 1959 ජූනි මස සිට 1964 ජූලි මස දක්වා.

(ලුතිනන් කොමාන්ඩර් එන්.පී.එස්. විජයවික්‍රම මහතා 1964 ජූලි මස සිට 1972 දක්වා සෙනේට් මන්ත්‍රණ සභාවේ අධිකාරි ධුරය ද ජෙන්ට්ල්මෙන් අෂරර් තනතුර ද දැරීය).

